උඩුදුම්බර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 09 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) යන්ත්‍ර හා උපකරණ අයිතම 4 ක ආරම්භක වටිනාකම මිලදී ගැනීම් ලෙස නැවත සටහන් කිරීම නිසා එම ගිණුමේ ශේෂය රු.61,070 කින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවල ස්ථාපනය කර තිබූ ජල යෝජනා ක්‍රම 3 ක වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේදී වැඩිදියුණු කළ ජල යෝජනා ක්‍රම 2 ක වටිනාකම රු.2,512,045 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් සියලුම ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයක එකතු වටිනාකම රු.12,008,673 ක් වූ අතර, එහි වර්ෂ 1 සිට 5 දක්වා කාලයකට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.1,767,633 ක් හා වර්ෂ 5 ඉක්මවූ රු.197,481 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂයක වටිනාකම රු.12,410,918 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයකට අනුව වසර 5 ක් ඉක්මවූ ගිණුම් ශේෂවල එකතුව රු.11,707 ක් වී තිබුණු අතර, වසර 1 ත් 5 ත් අතර ශේෂවල වටිනාකම රු.2,235,858 ක් වී තිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.24,500,390 ක් වූ ගනුදෙනු 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 18 වගන්තිය | | ප්‍රජාශාලා, සුසාන භූමි හා මංමාවත් ඇතුළු වත්කම් 99 ක් සඳහා හිමිකම් පෑමට හැකි ලියවිලි ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2)(ආ) | 157,921 | වසර 2 ක් ඉක්මවූ තැන්පතු 10 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවරන ලද රෙගුලාසි වලට අනුකූල වූ අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | 13,200 | බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව වී ඇඹරුම්හල් ඇතුළු කර්මාන්ත 3 ක් පවත්වාගෙන ගොස් තිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | පරිගණක සහ උපාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය | 62,557 | කොන්ත්‍රාත් පදනම මත 2016 ඔක්තෝබර් මස 19 දින සිට බඳවාගෙන තිබූ තාක්ෂණ නිලධාරී වෙත 2016 ඔක්තෝබර් 19 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ජීවන වියදම් දීමනාවක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ | |
| | (i) 10 ඡේදය | සභාව සතු කඩ කාමර අතුරු බදු දීම නොකළ යුතු වුවත්, බදුකරුවන් විසින් විවිධ ආකාරයට විවිධ පුද්ගලයන් වෙත අතුරු බදු දීම සිදු කර තිබුණි. |
| | (ii) 12 ඡේදය | සභා අවසරයකින් තොරව කඩ කාමරවල ව්‍යුහය වෙනස් නොකළ යුතු වුවත්, පොදු වෙළඳපළ කඩ සංකීර්ණයේ අංක 01 කඩ කාමරය කොටස්කර බෙදා එයින් එක් කොටසක් වෙනුවෙන් මාසිකව රු.2,000 බැගින් ලබා ගෙන තිබුණි. |
| | (iii)13 ඡේදය | කඩ කාමර බදු දීමේදී රාජ්‍ය ආයතන සඳහා විශේෂ අනුග්‍රහ ලබා නොදිය යුතු වුවත්, ටෙන්ඩර් කිරීමකින් තොරව ආයතන 4 කට ගොඩනැගිලි ලබා දී තිබුණි. |
| (උ) | 2013 ජූලි 31 දිනැති අංක 07 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය හා ත්‍රී රෝද රථ නියාමනය පිළිබඳ උපදෙස් දී ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය | ත්‍රී රෝද රථ සේවාව විධිමත් කිරීමට පළාත් පාලන ආයතන වෙත බලය පවරා විධිවිධාන නියමකර ඇතත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,783,732 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,687,732 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,196,000 | 1,277,747 | 1,023,324 | 254,423 | 671,000 | 637,944 | 540,702 | 97,241 |
| කුලී | 1,830,000 | 1,979,240 | 1,746,560 | 232,680 | 1,555,000 | 1,779,710 | 1,871,395 | (91,684) |
| බලපත්‍ර ගාස්තු | 1,290,000 | 1,131,590 | 833,140 | 298,450 | 940,100 | 1,206,750 | 1,058,700 | 148,050 |
| වෙනත් ආදායම් | 4,979,000 | 8,964,052 | 7,124,889 | 1,839,163 | 4,449,500 | 3,428,075 | 5,237,738 | (1,809,663) |
| | 9,295,000 | 13,352,629 | 10,727,913 | 2,624,716 | 7,615,600 | 7,052,479 | 8,708,535 | (1,656,056) |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

(i) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.210,765 ක් වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළදී ඉන් අයකර ගෙන තිබුණේ රු.97,942 ක මුදලකි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.246,185 ක් වූ අතර, එම ශේෂය තුළ වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ රු.112,823 ක් ඇතුළත්ව තිබුණි.

(ආ) අක්කර බදු

(i) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.197,257 ක් වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.6,972 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි අක්කර බදු ශේෂය රු.200,564 ක් විය. එම ශේෂයට වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාළ රු.51,620 ක් හා වර්ෂ 5 ඉක්මවූ රු.138,665 ක් ඇතුළත් විය.

2.2.4 වෙනත් ආදායම්

(අ) කුලී රථ හා ත්‍රී රෝද රථ ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී රථ හා ත්‍රී රෝද රථ ගාස්තු ශේෂය රු.222,300 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1 සිට 5 දක්වා අතර කාලයක සිට අයවිය යුතු රු.175,100 ක් ඇතුළත් විය.

(ආ) ට්‍රැක්ටර් හා බවුසර් සේවා ගාස්තු

-------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.66,000 ක හිඟ ශේෂයක් පැවති අතර, එම ශේෂය වර්ෂ 5 ක කාලයක් ඉක්මවා තිබුණි.

(ඇ) ජල ගාස්තු

--------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.686,844 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.402,238 ක මුදලක් පමණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.594,879 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාළ රු.108,829 ක් හා වර්ෂ 5 ඉක්මවූ රු.138,665 ක් ඇතුළත්ව තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.59,285 ක් හා මුද්දර ගාස්තු රු.2,594,694 ක්විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.2,594,694 ක හිඟ මුද්දර ගාස්තුව තුළ වසර 5 ට වැඩි රු.11,000 ක ශේෂයක් සහ වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ රු.763,954 ක ශේෂ පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රතිපාදන වැය කිරීම

------------------------

සභාවේ ස්වයං උත්පාදන ආදායමෙන් අවම වශයෙන් සියයට 30 ක් සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.8,497,334 ක පුනරාවර්තන ආදායමෙන් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදවා තිබුණේ රු.1,133,474 ක් පමණක් බැවින් එය සියයට 13 ක් විය. ප්‍රාග්ධන ආධාර වශයෙන් ලැබී තිබූ රු.17,977,168 ක මුදලින් ප්‍රාග්ධන වියදම් සඳහා දරා තිබුණේ රු.14,342,954 ක මුදලක් පමණි.

(ආ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 2 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු එක් කර්තව්‍යයක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come)ලබා නොගැනීම

------------------------------------------------------

පුරනැගුම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මඟින් රු.42,160,398 ක් වැය කර බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 4870 ක ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයේ මාසිකව එකතුවන කසළ වලින් දිරන කසළ ටොන් 1.5 ක් සහ නොදිරන කසළ ටොන් 0.5 ක් කෙච්ලේගම කොම්පෝස්ට් අංගනයට යවා තිබුණි. මෙම කොම්පෝස්ට් අංගනයේ කොම්පෝස්ට් අගල හා ගබඩාව සඳහා 2010 වර්ෂයේදී රු.3,487,828 ක මුදලක්ද, යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට 2012 – 2017 වර්ෂවලදී රු.5,069,140 ක මුදලක් වැයකර තිබුණි. නිරීක්ෂණ පහත දැක්වේ.

(i) කොම්පෝස්ට් අගලට ඉහළින් සකස් කර ඇති වහලය නිසි පරිදි ඉදිකර නොතිබීම නිසා බැකෝ යන්ත්‍රය මඟින් කසළ පෙරලීම හා දිරාපත් වූ කසළ ගොඩ දැමීමට නොහැකි වී තිබූ අතර පරීක්ෂණ අවස්ථාව වන විට කොම්පෝස්ට් අංගනයේ කසළ පිරී තිබුණි.

(ii) කසළ අංගන ඉදිකර යන්ත්‍ර සූත්‍ර මිලට ගෙන ඉහළ ගුණාත්මක බැවින් යුතු කොම්පෝස්ට් පොහොර ප්‍රජාවට ලබාදීම, කාබනික පොහොර ගෙවතු වගාව සඳහා ලබාදීම, කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම ආදිය අරමුණු කරගෙන තිබුණද 2018 ජනවාරි මාසය දක්වාම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු කර නොතිබුණි.

(ඊ) තිරසාර සංවර්ධන ඉලක්ක

--------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිගණක හැකියාව විමසීමේ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මත පුහුණු දීමනා ප්‍රතිපූර්ණය කර ගන්නා තුරු 2013 මාර්තු 08 දින රු.3,783 ක අත්තිකාරම් මුදලක් සහ පළාත් පාලන ඩිප්ලෝමා පාඨමාලා 2016/2017 සඳහා සහභාගීවන නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා ගාස්තු ගෙවීමට 2017 මාර්තු 17 දින රු.150,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද 2018 මැයි 18 දින දක්වාම එම මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී රු.817,000 ක් හා 2017 වර්ෂයේ රු.4,758,528 ක වියදමක් දරා තිස්ස අත්තනායක සම්මන්ත්‍රණ ශාලාව අලුත්වැඩියා කර තිබුණි. 2018 ජනවාරි 24 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටත් ගලවා ඉවත් කරන ලද බල්බ්, දොර ජනෙල් සහ උළුවහු ආදිය ගොඩනැගිල්ලේ ඉදිරියේ

ගොඩගසා තිබුණි. මෙම ගොඩනැගිල්ල කුලියට ගැනීමට පැමිණෙන්නන්ගේ සිත් ඇදගන්නා ආකාරයට අවට පරිසරය ශුද්ධ පවිත්‍රකර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට සකස් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

----------------------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී සේවක අතිරික්තතා 01 ක් හා සේවක ඌනතා 29 ක් විය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ජල ව්‍යාපෘති 3 හි ජල පාරිභෝගික සංඛ්‍යාව 523 ක් වූ නමුත් ජල මනු සවිකර තිබුණේ 135 දෙනෙකු සඳහා පමණි. ඉතිරි පාරිභෝකයින් 388 දෙනාගෙන් වාණිජ්‍ය ආයතනවලින් රු.200 ක් හා ගෘහස්ථ පාරිභෝගිකයින්ගෙන් රු.150 ක ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපළ කඩ කාමරවලින් රු.79,440 මුදලක් අයවිය යුතුව තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

3.5.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

(අ) පළාත් පාලන ආයතනවලට යන්ත්‍රෝපකරණ බෙදාදීමේ වැඩසටහන යටතේ රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2015 වර්ෂයේදී සභාව වෙත ලබා දී තිබුණු රු.17,649,179 ක් වන බැකෝ ලෝඩරය හා රු.6,009,602 ක් වටිනා ඩම්ප් ට්‍රක් රථය ඉතා සුළු කාලයක් පමණක් භාවිතා කර තිබීම නිසා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) සභාවට අයත් පරණ ගම්සභා කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ එක් කාමරයක සංවර්ධන නිලධාරී කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන අතර, එම ගොඩනැගිල්ලේ ඉතිරි කොටස වසර ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි.

3.6 ප්‍රසම්පාදනය

----------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.3,724,877 ක ප්‍රාග්ධන වියදම දරා තිබුණද සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.6.2 සැපයීම් හා සේවා

---------------------

තිස්ස අත්තනායක සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීම

----------------------------------------------------------------

2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ රු.5,400,000ක ප්‍රතිපාදන මත තිස්ස අත්තනායක සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම කර්මාන්තය ඉටුකර තිබූ දර්ශන කන්ස්ට්‍රක්ෂන් විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් ටිපෙක්ස් ගා වෙනස් කර තිබුණි.

(ii) ඇස්තමේන්තුවේ අංක 08, 17, 18 අයිතමයන් ඇස්තමේන්තු කළහැකිව තිබියදී වැඩ විෂයයන් අතිරේක වැඩ ලෙස දමා තිබුණු අතර, ඒ සඳහා අතිරේක ඇස්තමේන්තුවක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) ප්‍රජාපාදක සමිතිවලට කොන්ත්‍රාත් පැවරීම

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී රු.7,745,000 ක් වටිනාකම වූ කර්මාන්ත 17 ක් ප්‍රජාපාදක සමිතිවලට ලබා දී තිබුණි. පළාත් පාලන ආයතන පිහිටි බල ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීමේදී ප්‍රජා දායකත්වය ලබා ගැනීම හා ව්‍යාපෘති ඉහළ ගුණත්වයකින් ඉටු කර ගැනීමේ අරමුණින් ප්‍රජාපාදක සමිතිවලට සෘජු කොන්ත්‍රාත් පැවරීමට 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් ප්‍රතිපාදන සලසා දී තිබුණද, මෙම බොහෝ ව්‍යාපෘති සමිති මාර්ගයෙන් ලබාගෙන වෙනත් කොන්ත්‍රාත්කරුවන් හා පුද්ගලයන් ඉටුකරන බව සනාථ වූ අතර, එකී කර්මාන්ත ගුණත්වයෙන් හා ප්‍රමිතියෙන් යුක්තව ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) උඩුදුම්බර හාල්යාල පාර වැසි ජල කාණුව සෑදීම

--------------------------------------------------------

2017 වර්ෂයේ සභා අරමුදල් යටතේ උඩුදුම්බර හාල්යාල පාර වැසි ජල කාණුව ඉදිකිරීම රු.1,000,000 ක වටිනාකමකට උඩුදුම්බර ග්‍රාමීය සමෘද්ධි සමිතියට පවරා රු.876,082 ක වැඩ නිම කර තිබුණි. මෙම කර්මාන්තය 2018 ජනවාරි 23 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඇස්තමේන්තුවේ වැඩ විෂයය 4 අනුව 1:2:4 (19 mm) කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කළයුතු වුවත්, කාණුවට දමා තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ii) කොන්ක්‍රීට් කාණුවේ පතුල ඝනකම අඟල් 04 ක් යෙදිය යුතු වුවත්, ස්ථාන 4 කින් කඩා බැලීමේදී පතුලේ ඝනකම අඟල් 3, 3, 4, 3 ½ ආදී වශයෙන් විය.

(iii) කාණුවේ කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වල මට්ටමක පැවති බැවින් මෙම කාණුව වෙනුවෙන් ගෙවා තිබූ රු.876,082 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

(ඇ) හුන්නස්ගිරිය ජල යෝජනා ක්‍රමය අළුත්වැඩියාව

2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.4,325,000 ක ප්‍රතිපාදන මත වැඩ ආරම්භ කර තිබූ හුන්නස්ගිරිය ජල යෝජනා ක්‍රමය අලුත්වැඩියා කිරීම 2017 දෙසැම්බර් 26 දින වන විට ඇස්තමේන්තුවේ වැඩ අංක 01 සිට 33 දක්වා රු.1,309,587 ක මුදලක් ගෙවීමට නිර්දේශ කර තිබුණ ද, 2018 ජනවාරි 24 දින පරීක්ෂණ අවස්ථාව වන විටත් ජල ව්‍යාපෘතියට අදාළ පෙරහන් ටැංකියේ ඇතුළත කපරාදු වැඩ කොටස් ඉටු කරමින් පැවතුණි. රු.4,325,000 ක ප්‍රතිපාදනයෙන් රු.1,309,587 ක වැඩ කොටසක් පමණක් ඉටු කිරීම නිසා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම වෙනුවෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මුදලින් සියයට 69.7 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) අස්වැද්දුම කෘෂි පාර සංවර්ධනය කිරීම

2017 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අස්වැද්දුම කෘෂි පාර සංවර්ධනය කිරීම රු.300,000 ක වටිනාකමකට නුගේතැන්න බටහිර ගොවි සංවිධානයට පවරා රු.270,000 ක වැඩ නිමකර තිබුණි. මෙම කර්මාන්තය 2018 ජනවාරි 23 දින පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 ඔක්තෝබර් 14 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2/2011 දරන පළාත් පාලන ආයතනවල කර්මාන්ත ඉටු කිරීමේ ක්‍රියා පිළිවෙළ යන මැයෙන් යුතු චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ප්‍රතිපාදන මත කර්මාන්තයන් ඉටු කිරීමේදී ප්‍රයෝජනයට ගන්නා ප්‍රතිලාභීන් සංඛ්‍යාව 20 කට වැඩිවිය යුතු වුවත්, එක් ප්‍රතිලාභී පවුලක් වෙනුවෙන් මෙම කර්මාන්තය ඉදිකර තිබුණි.

(ii) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3:2 (1) ඡේදය ප්‍රකාරව සමිතියේ මූල්‍යමය හැකියාව සනාථ කරගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු අතර පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 12 ක් සඳහා සලසා දී තිබුණු රු.2,360,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 23 ක ශුද්ධ ප්‍රතිපාදනය හා ඉතිරිය අතර සියයට 30 සිට සියයට 92 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 42 ක ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් අතර සියයට 25 සිට සියයට 13200 අතර පරාසයක විචලනයක් පැවතුණි.

(ඈ) ආදායම් විෂයයන් 10 ක රු.2,483,000 ක් වූ ආදායමෙන් කිසිදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර තිබුණු නමුත් එම නිලධාරියාට වෙනත් රාජකාරී පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. 2017 වර්ෂයේ විගණන වාර්තා 2 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර සියළුම වත්කම් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | සභාව සතු ඉඩම් විධිමත් අනුමැතියක් නොමැතිව බාහිර පාර්ශවයන්ට භුක්ති විඳීමට ඉඩ සැලසීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | සභාව සතු සියළු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | ගිණුම් ශේෂ කීපයක් නිරවුල් නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | ඇතැම් වාහන ඌන උපයෝජිතව පැවතීම. |
| | | (ii) | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබීම. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | සභාවේ කඩ කාමර වල නව තක්සේරුව මත ගිවිසුම්වලට එළඹ නොතිබීම. |
| | | (ii) | නව වරිපනම් ප්‍රදේශ හඳුනාගෙන නොතිබීම. |
| | | (iii) | හිඟ ආදායම් අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| (ඉ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | දිගු කාලයක් තිස්සේ නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබීම. |